# ආදිවාසි යක්ෂ ගෝත්‍රික ජනයා හා
# කතරගම
# පිළිබඳ කථාව

ලංකාවේ සම්පූර්ණ ඉතිහාසය කියන්ට හැකි නම් ඉන් වැඩි කොටසකින් කියවෙනු ඇත්තේ යක්ෂ ගෝත්‍රික දේශීය ජනයාගේ කතාවය; හෙවත් ලංකාවේ ආදීවාසී පවුල්වල නොහොත් මුල් පදිංචි කරුවන්ගේ පවුල් වල කතාවය. යක්ෂ ගෝත්‍රික ජනයා සිය මව්පස මුතුන් මිත්තන්ගේ පෙළපත, කුවේනි මාතාවගේ හා ඊටත් කලින් ඔවුන්ගේ යක්ෂ මුතුන්මිත්තන් වන්නිනායකවරුන් වශයෙන් නැත්නම් ලංකාවේ විශාල කැලෑ අභ්‍යන්තරයේ ස්වාමිවරුන් වශයෙන් සිටි කාලය දක්වා ඈතට ගෙනයති. මේ ජනයාට පැහැදිලිවම වැද්දෙ (දඩයක්කාරයෝ) හෙවත් ඔවුන් විසින්ම නම් කර ගන්නා පරිදි වන්නිය - ඇත්තෝ (කැලෑ පදිංචිකරුවෝ) අයත් වෙති. විරාගත ක්‍රමය අමතකව නොගිය ඒ ගම්වල අදත් යක්ෂ ගෝත්‍රික පවුල් වෘක්ෂයේ බොහෝ ශාඛා මල්පල දරයි. ශතවර්ෂ ගණනාවක දීර්ඝ කාලයක් තුළදී ඔවුන්ගේ ආහාර, ඇඳුම් පැළඳුම්, භාෂාව හා ආගම පවා වෙනස් වී තිබිය හැකි වුවද ලංකාවේ වන්නිකරයේ අභ්‍යන්තරයේ පැරණි දරු නැලවිලි ගී, ප්‍රස්තා පිරුළු හා ග්‍රාමීය සිරිත් විරිත් තුළ පුරාණ යක්ෂ ගෝත්‍රික මතක සටහන් දැනටත් ආරක්‍ෂා වී පවතී. බාහිර වෙනස්කම් සියල්ලක්ම පසෙකින් තිබියදී වන්නි නායකයන්ගේ ජීවය පැරණි හා නව වෙසින් තවමත් ආරක්ෂිතව පවතී.

වනය ප්‍රිය කරන ලජ්ජාශීලී වන්නියල - ඇත්තෝ වැනි ආදිවාසීහු ආගමනික ජන කොටස් විසින් යළි යළිත් නැගූ ආක්‍රමණ තරංග හමුවේ සිය මුතුන් මිත්තන්ගේ උරුමයෙන් වැඩි හරියක් ගසායාමට ඉඩ නොදී ආරක්ෂා කර ගැනීමට ආරම්භයේ සිටම සමත්ව සිටිති. සිය මුතුන්මිත්තන්ගේ භූමිය වෙනුවෙන් ලංකාවේ ආදීවාසී ජනයා තුළ ඇති ආදර කරුණාව දිවයිනේ ධනස්කන්ධය, ඓශ්වර්ය හා ගුඨ ලක්ෂණ පිළිබඳ සත්‍ය භාරකරුවන් හෙවත් ආරක්ෂක යන් වශයෙන් ඔවුන්ගේ විශේෂත්වය පැහැදිලිව පෙන්වයි.

**කන්දෙ යකාගේ කතාව**

අවුරුදු දස දහස් ගණනාවක් නැත්නම් ගණනය නොකළ හැකි තරම් දීර්ඝ කාලයක් වනයේ පදිංචිව සිටීම නිසාදෙ ලංකාවේ දේශීය ජනයා වන යක්ෂ ගෝත්‍රික යන්ට තමන් කෙරෙහිත් දිවයිනේ අනෙකුත් අදෘශ්‍යමාන භූතයන් කෙරෙහිත් හිතකාමී ගරු සරුවක් දක්වන ස්වකීය පරිසරය සමග සාමකාමීව ජීවත්වීමේ ක්‍රමයක් ආරක්ෂා කර ගැනීමට හැකිවී තිබේ. වන්නියල - ඇත්තන් අතර මහාර්ඝතම යක්ෂයා වූ කලී සදාකල්හිම තරුණ ස්වභාවයෙන් යුතු වූද කතරගමට අධිපති දෙවියන් වූ ද කන්ද කුමාර යනුවෙන් පුලුල්ව දන්නාවූද කන්දෙ යකා (කන්දෙ භූතයා) හෙවත් ගලේ දෙවියා ය. කෝපයට පත් කරනු ලැබුවොත් භයානක වන කන්දෙ යකා වූ කලී ස්වකීය ජනයා කෙරෙහි මහා ලෙන්ගතු මිත්‍රයකු හා ආරක්ෂකයකු වන්නාවූද, ජීවිතයේදී අනුගමනය කළයුතු හොඳම මාර්ග තමන්ට පෙන්වා දෙන්නා වූද අයකු බව ඔවුහු දනිති.

ශාස්ත්‍රපති
පැට්‍රික් හැරිගන්

කතරගම දෙවියන්ගේ ප්‍රභවය ගුප්ත කරුණු වලින් වැසී ඇති නමුත් වැද්දෝ, සිංහල හා දෙමළ බැතිමත්තු මෙන්ම උගත්තු ද මෙම දෙවියා නැතහොත් භූතයා ඉන්දියාවෙන් ලංකාවට ආ බව පිළිගනිති. කතරගම දෙවියන් හෙවත් කන්දෙ යකා වූ කලී දකුණු ඉන්දියාවේ දේශීය ජනයාට ඉතා හිතවත්, 'කෙලිලොල් සදාකාලික දරුවා වූ මුරුගන් නම් මහා දඩයක්කාර භූතයාම බව ඔවුහු පවසති.

මොහු දිවයිනේ නැගෙනහිර වෙරළේ වාලච්චේනෙයි අසල පෙරිය කඩුවෙකරෙහිදී නැවෙන් ගොඩබට බව කියවෙන සම්ප්‍රදායයක් දෙමළ කතා කරන වැදි ජනයා අතර පවතී. එනෙකුදු වුවත් ඔහු එහි නොනැවතී වන්නි අභ්‍යන්තරයට ගිය බව ඔවුහු පවසති.





*වල්ලි අම්මා. විහාර සිතුවමකි*

"ඔහු පැමිණ අපට ද්‍රව්‍යවල වෘක්ෂයන්ගේ හා සතුන්ගේ නම් කියාදුන් අතර දඩයම සඳහා වනාන්තරයට යනවිට හා වෙනත් අවස්ථාවලදී පූජා හා නැටුම් පැවැත්විය යුතු ආකාරය ගැන ද කියා දුන්නේය. අප දන්නා හැම දෙයක්ම කියා දුන්නේ ඔහුය" යි වැදිජනයා පවසති.

## වල්ලි අම්මා

කතරගම පිළිබඳ මුල්ම ජනතාව වන මෙම පුරාණ භූතයා දේශීය වීරවරියක වූද ගලේ මහා දෙවියන් හා විවාහ වීමේ අභිංසක එහෙත් දැඩි ආශාවකින් සිටියා වූද පිවිතුරු හදවතක් සහිත යෞවන දැරිය හා පැවැත්වූ රහසිගත ප්‍රේම සම්බන්ධයක් චිත්‍රණය වෙයි. .අද වන්නියාල - ඇත්තන්ගේ සංස්කෘතිය වූ කලී බොහෝ දුරටම දුරාතීයේ, එනම් පූර්ව ඓතිහාසික යුගවල වන්නියාල - ඇත්තන්ගේ සංස්කෘතියම බව මෙම ජන කතාවල ඇති විස්තර අනුව පෙනේ.

ඒ අනුව වල්ලිගේ පවුල හා පෙළපතේ ජනයා දඩයමෙහි හා කැලෑ මී පැණි එක් කිරීමෙහි යෙදී සිටි අතර දෙවියන්ගේ කැලේ (දෙවියන්ට අයත් කැලෑවේ) ඝන වනාන්තරයේ කුඩා හේන් එළියක පැසී එන මෙනේරි කුඹුරක් කුරුල්ලන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා වල්ලි නවතා තිබුණි. 'ගල් පටිය පමණක් අතැතිව සිටි ඇගේ කාර්යය වූයේ ධාන්‍ය කොල්ලකන කුරුල්ලන් හා වනසතුන් එළවා දැමීමය.

ප්‍රයෝගකාරී දඩයම් දෙවි කන්දෙ යකා ඉවසීමෙන් යුතුව මෙය බලා සිට, දුන්නක් හා ඊතලයක් අතින් ගත් රූමත් දඩයම් කරුවකුගේ වෙසින් වහාම ඇය ඉදිරියේ පෙනී සිටියි. අනවසරයෙන් ඇතුලු වීම ගැන සමාව අයදින ඔහු, තමා මුවැත්තියක සොයා යන බව කියා සිටියි. (තමා සොයා ගිය මුවැත්තිය වල්ලිම බවට ඔහු පාපෝච්චාරණය කරන්නේ ඊට බොහෝ පසුවය.) මෙම දෙවියා සිය ජීවිතයේ රහස්‍ය ප්‍රේමවන්තයා වන බව නොදත් කුලැටි යෞවනිය තමාගෙන් ඉවත් වී යන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියි. එනෙකුදු වුවත් වෙනත් වෙස් මවාගෙන ඇය වෙත ආපසු එන ඔහු තමාගේ අවධානයට ලක්වූ ප්‍රියංකර වස්තුවට රහසින් ආලය කරන අතරම ක්‍රමයෙන් තමා කවුදැයි අනාවරණය කර සිටියි. ඒ වූකලී අද්භූත කරුණු වලින් ගැඹුරට ගිය ප්‍රේමකතාවකි. දේශීය දැරියක හා පැරණි දෙවියකුගේ අවතාරයක් අතර ඇතිවිය නොහැකි ප්‍රේම සම්බන්ධයක් පිළිබඳ අද්භූත සිද්ධිය සෙල්ල (පුංචි) කතරගමදී ආරම්භ වී එතැනින් පෙම් යුවල සිය මධුසමය ගත කිරීමට සප්ත ශුද්ධ කඳු කරා ගොස්, අනතුරුව සප්ත කඳුවලින් උතුරේ මැණික් ගඟේ වම් ඉවුරේ සිය වර්තමාන නිවහන පිහිටි භූමි භාගය කරා යාම දක්වා දිවෙයි. අද පවා මෙම පෙදෙසේ පදිංචි කරුවන් හා අනෙක් බැතිමතුන් කියා සිටින්නේ ශුද්ධ වූ යුවල තවමත් කතරගම වාසය කරන බවය.



### ගෞරව දැක්වීම් හා පොරොන්දු

අද වන්නිය ල - ඇත්තෝ කතරගම පුරාන චාරිත්‍ර බොහොමයක් දිගින් දිගටම ආරක්‍ෂා කර ගනිමින් සිටිති. දඩයමකට හෝ වෙනත් කිසියම් වැදගත් කටයුත්තකට යාමට කලින් ඔවුහු කන්දෙ යකාගේ නම කියා ඔහුගේ පිහිට ඉල්ලා සිට ඔහු වෙනුවෙන් පෙරළා ඉටුවිය යුතු කොටස ඉටු කිරීමට පොරොන්දු වෙති. ඔහු තමන්ට ආදරය කරන අතරම පිහිට වීමට ද කැමැත්තෙන් සිටින බව දීර්ඝ කාලයක් තිස්සේ ලැබූ අත්දැකීම් අනුව ඔවුහු දනිති. ඔහුගේ සලකුනු නොසලකා හැරීම වූ කලී වේදනාව හා අවාසනාවට කරන ඇරයුමක් ලෙස ඔවුහු සලකති. ඉතා දීර්ඝ කාලයකට පෙර වන්නියල ඇත්තන්ගේ මුතුන් මිත්තෝ ස්වකීය නොපෙනෙන මිත්‍රයාගෙන් ඔහුගේ කරුණාව, අනුග්‍රහය හා ආරක්‍ෂාව ලබා ගන්නා හැටි ඉගෙන ගත්හ. මේ සඳහා එක් නොවරදින ක්‍රමයක් නම් ඔහු වෙනුවෙන් කවර හෝ නරාතිරමේ භාරයක් හෝ පොරොන්දුවක් වී එය ඉටු කිරීමකි. දෙවියන් ද සිය වචනය ඉටු කරන බව බැතිමතුන්ට පෙනුන විට ඔහු මිත්‍රයන් අතරින් ශ්‍රේෂ්ඨ තමයා බව ඔවුහු දැන ගනිති.

නිදසුනක් වශයෙන් අද පවා ඔවුහු පුරාණ සිරිත අනුව දෙවියන්ගේම කැලෑවේ වන සතුන් දඩයම් කරති. නිහඬ බව හා රහස් ස්වභාවය පැවතුනත් ආලවිටි අම්මාවරු නොහොත් පනත් චාරිතරයට සම්බන්ධ ලඳුන්ගේ නායකයා හෙවත් 'ගුරු' පවා කියා සිටින්නේ ස්වකීය මුතුන්මිත්තන්ගේ පරම්පරාව (සම්ප්‍රදාය) වල්ලි අම්මාගෙන්ම පැවත එන බවයි.

වැද්දන්ගේම වල්ලි අම්මා පරම්පරාව පවා කතරගම මුල් පරම්පරාවේ ගුරුන් ලෙස සලකනු ලැබීය. පුරාණයේ සිටම තමන්ට පැවති අයිතිය උඩ දුනු ඊතල පාවිච්චි කරන සැඟවී සිට කෙරෙන පහර දීමක් මගින් ඔවුන් විසින් පෙරහැර නවත්වනු ලැබිය හැකිය. ඉන්පසු වන්නියාල ඇත්තන් විසින් දරුණු ගති අත්හැර වල්ලි අම්මා දේවාල නිවහන වෙත දෙවියන් වඩම්මාගෙන ගොස් දෙවියන් වෙත පිටුපස නොහරවා ආපසු යන්නේ, උසස් නිලධාරීන් විසින් මෙම චාරිත්‍රයට ගෞරව දැක්වීමෙන් වැදී ජනයාගේ මෙම අයිතිය දැනුම් දුන් පසුව පමණි.



කතරගම ප්‍රාග් ඓතිහාසික යුගයට පෙර සිට ප්‍රසිද්ධියක් උසුලන නැගකි.

### සැඟවී සිට පහරදීමේ චාරිත්‍රය

රුහුණු මහා කතරගම දේවාලයේ පැරණි **රාජකාරි** සම්ප්‍රදායයන් හෙවත් 'රාජකීය කටයුතු' ආරක්ෂා කරමින් සිටින අය, ස්වකීය සම්ප්‍රදායයන් පැවත එන්නේ වන්නියාල - ඇත්තන් ගෙන් බව දනිති. කපුරාලවරුද මේ බව නිරායාසයෙන්ම පිළිගනිති.

### නර්ජන ලද්දෙ

ලෝකයේ අන්‍ය ආදිවාසික මිනිසුන් මෙන්ම ලංකාවේ වන්නිය ල - ඇත්තන් ද ඔවුන් විසින් පාලනය නොකළ හැකි අන්දමේ පුද්ගලික නොවන ගාලවේග මගින් සංස්කෘතිකමය විනාශ යේ ඉම දක්වා නල්ලු කරනු ලැබ ඇත. ඔවුන්ගේ මුතුන් මිත්තන්

විසින් වසර දහස් ගණනක් තිස්සේ සාර්ථක අන්දමින් පාලනය කොට ගෙන ආ පුරාණ දඩබිම් ද වේගවත් සංවර්ධන වැඩ සටහන් මගින් ග්‍රහණය කරනු ලැබ ඇත. තමන්ගේ ඉපැරණි ජීවන ක්‍රමය පවත්වා ගෙන යාමට ක්‍රමයක් නැතිව ගොස් ඇති වැදිජනයාට අද සිදුවී ඇත්තේ 'මුදල්' ස්වකීය 'මහ දෙවියා' බවට පත් කර ගත් අමුතුම පන්නයේ සමාජයක සිට ස්වකීය ආත්මාරක්ෂාව සඳහා සටහන් කිරීමටය. මෙම ක්‍රියාවලියේදී සිය වන වාස භූමි මෙන්ම ඉපැරණි ජීවන ක්‍රමයද නවීන ක්‍රම නිසා සදහටම විනාශ වී යනු ඇත්දැයි ඔවුහු බියෙන් පසුවෙති.



සැගට් සිට පහරදීමේ චාරිත්‍රය

ස්වකීය පරිසරය අනාගත පරම්පරාවන් සඳහා ආරක්ෂා කරතැබීම සම්බන්ධයෙන් ආදිවාසි ජන කොටස්වලට කළ හැකි සේවය ආදිවාසි නොවන ජනයාට වැටහෙන්ට පටන් ගෙනඇත්තේ මෑතක සිටය. ඇත්ත වශයෙන්ම ස්වකීය මව්බිම කෙරෙහි ආදිවාසි ජනයා තුළ ඇති පුළුල් දැනුම හා ඔවුන් ඒ කෙරෙහි දක්වන ආදර සැලකිල්ල, පෘථිවියේ ජීවින්ගේ මෘදු සමබරතාව විනාශ කර දැමීමේ තර්ජනය එල්ල කොට සිටින ' පළමුව මමයි' යන වත්මන් සමාජයේ විෂදායක මානසික ස්වභාවයට විෂනාශක ඖෂධයක් වන්නේය.

විත්තවේගීය නොවන ස්වභාවයක් දරන ස්වකීය පුරාණ සංස්කෘතිය නිසාදෝ ශ්‍රී ලංකාවේ වන්නියාල ඇත්තෝ උද්ඝෝෂණ හෝ ආයුධ එල්ල කිරීමක් නොකොට ඒ වෙනුවට ඌරුවරිගේ තිසාහාමි නම් ස්වකීය කුල ජ්‍යෝෂ්ඨයාගේ නායකත්වයෙන් යුත් වැඩි හිටියන්ගේ නැණවත් උපදෙස් කෙරෙහි විශ්වාසය තබා ඇත. එයට අමතරව ඔවුහු ස්වකීය සංස්කෘතිය කෙරෙහි මැදිහත් වී එය මුළුමනින්ම විනාශ වීමෙන් බේරා දෙන ලෙස දිනපතාම කන්දෙ යකාට බලවත් ලෙස යාඥා කොට සිටිති. අන්‍ය ජනකොටස් වල බැතිමත්හුද එම උපකාරය තමන්ට ලෙස යාඥා කොට සිටිති. අන්‍ය ජනකොටස් වල බැතිමතුන්ගේ ද උපකාරය තමන්ට ලබා දෙන ලෙසට කතරගම දෙවියන්ට යාඥා කරති.

## සංස්කෘතික උන්නතිය

දේශීය සංස්කෘතීන් ආරක්ෂා කිරීමේ කඩිනම් අවශ්‍යතාව එක්සත් ජාතීන් දැන් පිළිගන්නා අතර, 1993 වර්ෂය ලෝකයේ ආදිවාසීන් පිළිබඳ ජාත්‍යන්තර වර්ෂය වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇත. ශ්‍රී ලංකා රජය ද ආදිවාසී සංස්කෘතිය ආරක්ෂා කොට පෝෂණය කිරීමේ අවශ්‍යතාව ඒත්තුගන්වන අතර අතීතයේදී ශතවර්ෂ ගණනාවක් සිදුවූ අසාධාරණය නැති කිරීමට තදින් කටයුතු කරයි. මේ වසරේ මුල් භාගයේදී විශ්ව විද්‍යාල අධ්‍යයනයක් ලත් වැදි තරුණයකු, ආදිවාසි ජනයා හා සංවර්ධන ආයතන පිළිබඳ ප්‍රධාන සම්මේලනයකදී සිය ජනයා නියෝජනය කිරීම සඳහා පිලිපීනයට යවන ලදි. ඊට කලින් ඔහු රජයේ අනුග්‍රහය ලත් වන්නියල ඇත්තෝ භාර මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම ආදිවාසික සාමාජිකයා ලෙස පත් කරන ලදි. මේ ආකාරයට දීර්ඝ කාලයකට පසු සිය ආදිවාසි පුරවැසියන්ට කන්දීමට රජය පටන් ගෙන තිබේ.

## සාම කලාපය

1983 දී වන්නියල-ඇත්තන්ගෙන් ගනු ලැබූ වන ඉඩම්, වන්නියල ඇත්තන්ගේ සංස්කෘතික ක්ෂේම භූමියක් ලෙස පාලනය කිරීම සඳහා ඔවුනට ආපසු භාරදෙන ලෙස සංස්කෘතික උන්නති ව්‍යාපාරය මැතදී රජයට යෝජනා කොට තිබේ. මෙම සැලැස්මට පදනම් වී ඇත්තේ කතරගම ශුද්ධ භූමිය සාම කලාපයක් බවට ප්‍රකාශයට පත් කිරීම සඳහා වූ 1989 යෝජනාව හා විරාගත හර පද්ධතීන්ට බාධාකාරී වන කටයුතු නීතියෙන් සීමා කෙරෙන ශුද්ධ පාරිසරික ක්ෂේමභූමි ඇති කිරීම සඳහා 1991 කොළඹ දී පැවැත්වුනු සාක් සමුළුවට පවන ලද යෝජනාවකුත් ය.

වන්නියල ඇත්තෝ කුලැටි වූද මෘදු කථා විලාශයක් ඇත්තාවූද ජන කොටසක් වන නමුත්, ඔවුහු ආධ්‍යාත්මික හා පාරිසරික උරුමයන් ආරක්ෂා කිරීමේ ලෝක ව්‍යාපාරයේ පෙරමුණේ සිටිති. මේ ජනයා අනරින් කවරෙක් නම් කතරගම දෙවියන්ට ස්වකීය යාඥා නො ඇසෙතියි සැක පහළකර ගනිත් ද